# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,873/7 — 1969 ඔක්තෝබර් 1 වැනි බදාදා — 1969.10.1

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

ඇල්.ඩී.—බී. 31/47

### ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත

(262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 84 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාව.

ආර්. ප්‍රේමදාස,
පළාත් පාලන ඇමති.

1969 සැප්තැම්බර මස 30 වැනි දින,
කොළඹ දීය.

### ආඥාව

(262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතෙහි පටහැනිව කුමක් සඳහන් වුවද, මීට යා කොට ඇති උප ලේඛනයේ දක්වෙන එක් එක් ප්‍රාදේශීය බලමණ්ඩල පිහිටා ඇති දිස්ත්‍රික්කයේ මැතිවරණ නිලධාරියා විසින් එකී එක් එක් ප්‍රාදේශීය බල මණ්ඩලයේ ඡන්ද ලැයිස්තු සකස් කිරීමේ සහ මහා ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්‍යයන් සඳහා ප්‍රාදේශීය බල මණ්ඩලවල දැනට සිටින සභිකවරුන්ගේ තනතුරු කාලය අවසන් වීමට නියමිත දිනය ගැන සැලකිලිමත් වෙමින් තමා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් දිනයන්හිදී, (262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 22 වැනි සහ 26 වැනි වගන්ති වලින් නියම කෙරෙන කටයුතු කළ යුතුය.

### උපලේඛනය

**කොළඹ දිස්ත්‍රික්කය**

අවිස්සාවේල්ල නගර සභාව

**ගාලු දිස්ත්‍රික්කය**

බෙන්තොට සුළු නගර සභාව

**බදුල්ල දිස්ත්‍රික්කය**

වැලිමඩ සුළු නගර සභාව

10–367


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.

794/1——ජේ 7482–5,250 (69/10)